

නිධානයක
සුලමුල
අති වික්‍රමාන්විත සොයායාම
නෙතුම් හේරත්

# නිධානයක සුලමුල

## නෙතුමි සෙහස්නා  හේරත්

කතෘ

## කතෘ ගේ වෙනත් කෘති

- තුන් ඉරි අප්පු
- අතුරුදහන් වූ ප්‍රතිමාව

මහාමායා  බාලිකා  විද්‍යාලය මහනුවර
9-A

ISBN 978-624-211-113-1



## පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පුජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# පිදුම

වදන් රසට ගලපාලා
නිවාඩුවේ ම පොතක් ලියා
එය ඔබ හට පුද දෙන්නට
මම ආසාවෙන් හිටියා
මහාමායා පොත් එළි දැ ක්මෙන්
ඒ සිහිනය සැබෑ වුණා
මගේ පැතුම් ඉටු වූවා
සොදුරු පොතක් මම ලිව්වා
විදුහල්පතිතුමියනි මගේ
පොත පුදදෙමි ඔබතුමියට
හදේ පිරුණු
ආදරයෙන්
ගෞරවයෙන්
හද බැතියෙන් !!!!!

එදා ඉරිදා දවසක් විය. එමා අවුරුදු 18ක තරුණියකි. ඇගේ විනෝදාංශය පොත් කියවීමයි. ඇය සෑම ඉරිදාවකම හා අගහරුවාදා දිනකම තම නැටුම් පන්තියට සහභාගී වෙයි. වෙනදාවාගේම ඇය එම නැටුම් පන්තියට යාමට සූදානම් විය. තම බෑගයද රැගෙන නිවසින් පිටත්ව ගොස් බස් රථය පැමිණෙන තුරු බලා සිටියාය. මද වේලාවක් යන තුරුම බස් රථයක් දැක ගැනීමටවත් නොහැකි විය. දැන් තමා හට පන්තියට යාමට ප්‍රමාද වන බව ඇය වටහා ගත්තාය. නමුත් තව සුළු මොහොතක් බලා සිටින්නට සිතූ ඇය, මාර්ගය දෙපස බලා සිටින්නට විය. ඒත් සමගම ඇගේ දුරකථනය නාද විය. එම ඇමතුම පැමිණ තිබුණේ එමා ගේ හොඳම මිතුරිය වන මිශෙල්ගෙන් ය. ඇය ද එම පන්තියට සහභා ගී වන්නී ය.

" එමා, මො කද මෙච්චර වෙලා කරන්නේ? අද ක්ලාස් එකේ මීටින් එකක් ගන්නවලු ඔයා එනකන් පටන් ගන්න බෑ නේ ඉක්මන් කරලා එන්නකෝ. " එමා මෙලෙස කියන්නට විය.
" පොඩ්ඩක් ඉන්න මට තාම බස් එකක් සෙට් උනේ නෑ බස් එක ආපු ගමන් මං ඔතන. යැයි කියා ඇමතුම විසන්ධි කළා ය.
සුළු වේලාවක් ගත වෙද්දී ම ඇයට බස් රථයක් දැක ගැනීමට හැකි විය. ඉක්මනින් බසයට ගොඩ වූ ඇයට පන්තිය වෙත යාමට ගත වුණේ විනාඩි 10කි.
ඉක්මන් ගමනින් පන්තියට ඇතුළුවී රැස්වීම සදහා සහභාගී විය. මෙම පන්තියට පීටර්, බාබරා, ජෝ ර්ජ්, වින්කල්, මිශෙල් හා ජැක් යන එමාගේ මිතුරන්ද සහභාගී වෙති. තම තමන්ගේ ආසනවල හිඳ ගත් පිරිස ගුරුතුමියගේ කතා වට සවන් දෙන්නට විය.

" ළමයි, ඔයාලට කියන්න දෙයක් තියෙනවා. අපි ගිය සැරේ ට්‍රිප් එකක් ගියා මතකයි නේද? අපි ඒ සැරේ ගියේ නුවරඑළියටනේ. මේ සැ රෙත් මම තීරණය කරා ට්‍රිප් එකක් යන්න."

" ෂා...නියමයි නේ මිස්. කො හෙද ඉතින් අපි යන්නේ?" පීටර් ඇසුවේ ය.
" මෙහෙමයි මම නම් ප්ලෑ න් කරේ මේ සැ රේ අපි කෑම්පින් යන්න. හොඳයි නේ ද? "
" මරු නේ මිස් මං කවදා වත් කෑම්පින් ගිහිල්ලා නෑ." යැ යි වින්කල් කිව්වේ ය.
" ඔයාලා මේකට කැ මතියි නේද ළමයි?"
" එකෙන් ම මිස් මන් නම් කැමතියි." කියා එමා කියනවාත් සමඟ ම අනෙක් හැමෝ ම එයට කැමැත්ත ප්‍රකාශ කළහ.

" හරි ළමයි එහෙනම් ඔයාල මේකට කැමතියි නේ. ඔයාලගේ අම්මලා ටත් මම මීටින් එකක් තියලා කතා කරන්නම්. එහෙනම් හෙට අම්මලාට එන්න පුලුවන් නේද? මන් ගෲප් එකට මැසේජ් එකක් දාන්නම්. "
" ඒක නෙවෙයි මිස්, අපි කවද්ද කෑම්පින් යන්නේ..? "
" ආ.. මන් නම් හිතුවේ ලබන මාසේ 4 වෙනිදා විතර යන්න. ම්ම්.. අද 28 නේ තව කල් තියෙනවනේ අපිට බඩු මුට්ටු ගන්න. හැමෝම එදාට ෆ්‍රී නේද? "

" ඔව් මිස් දැ නටනම් මුකුත් නෑ. " සැවොම කීහ.

" මම දන්නවා  හොඳ තැනක් කැම්පින් යන්න. මගේ මහත්තයා මේ තැන් ගැන හොඳට බැ ලුවා. ඊට පස්සේ මම හොඳ ප්ලේස් එකක් තේරුවා "
" මොකක්ද මිස්??" පිරිස උද්යෝගීමත්ව විමසූහ.
" බැරාරිවර් තමා ඒකෙ නම. ඒක හරි ලස්සන තැනක්. ඔයාලට ගිහිල්ලම බලාගන්න පුළුවන්. "හරි මිස්. දැන් අපි බඩු ගන්න යන්නෙ කවද්ද? "

" ම්ම්... අපි අඟහරුවාදා විතර යමුද? එදාට ක්ලාස් නොකර ඉමු. කමක් නෑ නේ." කමක් නෑ  මිස් කොහොමත් අපිට එදා ට ක්ලාස් නැත්තම් ෆ්‍රී. " යැ යි පීටර් කිව්වේ ය." එහෙනම් අපි අඟහරුවාදා ඒ කියන්නේ අනිද්දා බඩු ගන්න යමු." කියා  ගුරුතුමිය කිව්වා ය. මද වේලාවකට පසුව පන්තියේ වැ ඩ පටන් ගත්තේ ය.

* * * * * * * * * * * * * * * * *

අඟහරුවාදා  දින එළඹිණි. උදෑසනම නැගිට ගත් එමා ඇඳෙන් බැස මුහුණ කට සෝදා ගෙන තරප්පු පෙළ දිගේ පහළට බැස කෑම මේසයේ සකසා තිබූ ආහාර පාන දැ ක එමා පුටුවෙන් වාඩි වීය. කැම්පින් යාම සඳහා බඩු ගැනීම ද යොදා ගෙන තිබුණේ එදිනට ය. නමුත් එය එමා ට මතක තිබුණේ නැත. කෑ ම මේසයේ එමා ගේ මව, පියා හා වැඩිමහල් සහෝදරයා ද වාඩි වී සිටියහ.
" ආ..එමා  ගුඩ් මෝනින්. අද මොකද මේ කලින් නැගිටලා? "
එමාගේ මව ඇසුවා ය.

" ඊයේ රෑ මට නින්ද ගියේ නෑ 3 විතර යනකන්, ඊට පස්සේ තමයි නින්ද ගියේ. හැබැයි සැරින් සැරේ ඇහැරෙනවා." "ආ.. ඒ මොකද එමා ඔලුව රිදෙනව ද දැන්? " යැයි මව විමසුවා ය.

" ටිකක් රිදෙනවා ඒත් එච්චර ගානක් නෑ."

" කමක් නෑ කෝ කටත් මේ පැනඩෝල් එක බොන්න. "

" අනේ දැන් ඕක බොන්න බෑ  අම්මේ. පොඩි ඔලුවෙ කැක්කුමක්නේ."

" පණ්ඩිත වෙන්නේ නැතුව මේක බොන්න නංගී." එමා ගේ සහෝදරයා කිව්වේ ය. කවදත් තම අයියාට බය එමා, " හරි හරි කෝ ඕක දෙන්න මං බොන්නම්. යැයි කියූ එමා පෙත්ත බිව්වාය. මද වේලා වක් ගත විය. ආහාර ගනිමින් සිටිය දී මව මෙසේ ඇසුවා ය.

" එමා   අද ක්ලාස් යනව ද? " " බෑ වගේ අම්මේ. ඔලුවේ කැක්කුම හොඳ නෑ තාම. ක්ලාස් ගිහිල්ලා ඕක තව ව ඩි උනොත් එහෙම."" හරි හරි අදට එහෙනම් ඉන්නකෝ."

ආහාර ගැනීමෙන් අනතුරුව එමා තම කාමරය දෙසට යන තරප්පු පෙළ දිගේ නගිමින් සිටිය දී එමා ගේ කාමරයේ තිබූ දුරකථනය නාද විය.

එමා ඉක්මන් ගමනින් කාමරයට දුව ගොස් දුරකථනය අතට ගත්තාය. ඇමතුම පැමිණ තිබුණේ මිශෙල්ගෙන් ය.

" ගුඩ් මෝනින් එමා. ඔයා අද එනවා නේද? මිස් කිව්වා අද නම් හැමෝ ම අනිවාරෙන් එන්න ඔනි කියලා. මාත් ලෑස්ති වෙන ගමන් ඉන්නේ. "

මිශෙල් දිගට ම කියා ගෙන ගියා ය.

"අනේ අද මට ක්ලාස් එන්න වෙන්නෙ නෑනේ. උදේ ඉදන් මගේ ඔලුව රිදෙනවා."

" මොන ක්ලාස් ද එමා මතක නැද්ද අද තමයි අපි කම්පින් යන්න බඩු ගන්න යන දවස."

" හය්යෝ.... මට අමතක උනා නේ. මං හිතුවේ හෙට කියලා "

" පුදුම අමතක වීමක්නේ එමා අපේ අත්තම්මට වත් නෑ ඔහොම අමතක වීමක්." යැයි මිශෙල් සිනා සෙමින් පැවසුවා ය. " හරි හරි මං දැ න්මම ලෑස්ති වෙනවා."

" හරි එමා එහෙනම් අට හමාරට ක්ලාස් එක ගවට එන්න. අපි ඔක්කොම එතනදී එකතු වෙලා යමු."

කියා මිශෙල් ඇමතුම අවසන් කළා ය. " කොහොම අමතක උනා ද දන්නේ නෑ අප්පා.. ඉක්මනට ලෑස්ති වෙලා යන්න ඔනි."

එමා තමාට ම කියාගත්තා ය.

එමා ඉක්මනට ලෑස්ති වී තරප්පු පෙළ දිගේ පහළට බසිමින් සිටිය දී එමා ගේ මව ,

" එමා කොහො ද මේ ලෑස්ති වෙලා., කොහෙද යන්නේ? " ඇසීය.

"අනේ අම්මේ...මට අමතක උනා නේ අද තමා කෑම්පින් යන්න බඩු ගන්න යන දවස මං පටස් ගාල ගිහින් එන්නම් "

" ආ...හරි ෂෝක් දැන් ටිකකට කලින් තිබ්ච්ච ඔලුවෙ කැක්කුම කොහෙද ගියේ?

" ආ ඒක දැන් හොඳයි. හරි අම්මේ මට දැන් පරක්කු වෙලා තියෙන්නේ මං ගිහින් එන්නම් " කියා එමා ගෙදරින් පිටත් වුණාය. මද වේලාවකට පසුව බසයෙන් බැස තම නැටුම් පන්තිය කරා ළඟා විය. එමා පන්තිය වෙත යමින් සිටිය දී අනෙක් සියලු දෙනාම පැමිණ ඇති බව එමාට දැක ගැනීමට හැ කි විය.

" එමා ඔයාට නම් මාර මතකයක් නේ තියෙන්නේ " මිශෙල් පැවසුවා ය.

"තව ටිකෙන් අපි ඔයාව දාලායන්න හිටියේ අපි හිතුවේ ඔයා එන්නේ නැති වෙයි කියලා. දැන් වෙලාව 9යි. එහෙනම් අපි යමුද? "

ගුරුතුමිය කියනවාත් සමඟම බස් රථයක් පැමිණියේ ය. එයට නැග ගත් පිරිස නගරය බලා තම ගමන ආරම්භ කළහ. සුළු මොහොතකින් පිරිස නගරයට ළඟා විය. තම තමන්ට අවශ්‍ය බඩු ගැනීම සඳහා විවිධ වෙළෙඳසැල්වලට ගියහ.

" අපි ඉස්සෙල්ලාම ටෙන්ට් ගමු ඊට පස්සෙ අපි බලමු අපිට ගන්න තියෙන අනිත් දේවල් ගැ න "

ගුරුතුමිය පැවසුවා ය.

පිරිස ටෙන්ට් 4ක් හා වියළි ආහාර ද්‍රව්‍ය මිල දී ගත්හ.

අවශ්‍ය සියලු ම භාණ්ඩ මිල දී ගැනීමෙන් පසු වේලාව දහවල් 12 පමණ විය.

" අම්මෝ... වෙලාව 12ටත් ළඟයි. අපි ලන්ච් එකත් අරගෙනම ගෙදර යමුද?

මට බඩගිනියි. "
වින්කල් පැ වසුවේ ය.
" මටත් බඩගිනියි. උදේ කෑවට පස්සෙ බඩට මුකුත්ම නෑ."
ජැක් ද එයට එකඟ විය.
" එහෙනම් අපි යමු කන්න. "

ගුරුතුමිය එලෙස කීමෙන් අනතුරුව පිරිස අවන්හලක දහවල් ආහාර ගැනීම සිදු කළහ.
ආහාර ගැනීමෙන් පසුව සැවොම තම නිවෙස් කරා ගියහ.

* * * * * * * * * * * *

කැම්පින් යන දවස උදා විය. උදෑසනම නැගිට ගත් එමා සුපුරුදු ලෙස තම චර්යාවන් සිදු කොට තම නැ වුම් පන්තියට ගියාය. ඇය යන විටත් අනෙක් සියලු දෙනාම එතනට පැමිණ සිටියහ.
" ගුඩ් මෝනින් එමා අදත් ඔයා තමයි අන්තිමට ආවේ."
ජැක් පැවසුවා ය.
" සොරි සොරි අද මට ටිකක් වැඩිපුර නින්ද ගියා. හී..හී.."
" හරි හරි ළමයි හැමෝම ඇවිල්ලනේ ඉන්නේ? තව ටිකකින් බස් එක එයි. අපි රෙජිස්ටරේ මාර්ක් කරමු.
එමා? "
" ඉන්නවා "
" මිශෙල්?"
" ඉන්නවා "
" පීටර්? "
"ඉන්නවා "
" බාබරා ?"
"ඉන්නවා "
" ජෝර්ජ් ?"
"ඉන්නවා "
" වින්කල් ?"
"ඉන්නවා"
" ජැක්?"
" ඉන්නවා "
" හරි හැමෝ ම ඉන්නවා. ඔයලා අවශ්‍ය බඩු ටික ගත්තනේ මතක් කරලා ?"
" ඔව් මිස් ඔක්කොම ලිස්ට් එකට අනුව දා ගත්තා."
ජෝර්ජ් පැවසුවා ය.
" හොඳයි. "
" අන්න බස් එක එනවා " යැ යි බාබරා පැවසුවාය.

බස් රථය ද පැ මිණි පසු පිරිස එයට ගොඩ වූහ. එය A/C කරන ලද බස් රථයකි. බස් රථයට ගොඩ වී ගමන ආරම්භ කරන විට උදෑසන 7 පසු වී තිබිණි. පිරිස සින්දු කියමින් නටමින් විනෝද වෙමින් මෙම චාරිකාව ගියහ. පැය 3කින් පමණ බැරාරිවර් නම් කැම්පින් සයිට් එකට පැමිණීමට හැකි විය.

"ෂා... මේක නම් පට්ට ලස්සන තැනක් නේ. "
පීටර් කිව්වේ ය.

" ඒකනේ මමනේ මේක තේරුවේ...". යි ගුරුතුමිය පැ වසුවාය.
සුළු මොහොතකින් පිරිස් තම ටෙන්ට් ගහන වැ ඩේ ආරම්භ කළහ.
පිරිමි ළමයින්ගේ සහාය ද ඇතිව ටෙන්ට් 4ම සාදා අවසන් කළ පසු ගුරුතුමිය ළමයින් ඇමතූහ. " ඔයාලා නම් මන් හිතුවට වැඩිය හොඳට මේ ටෙන්ට් ගහන වැ ඩේ කරලා තියෙනවා. දැ න් ඔයාල ම කියන්න බලන්න ටෙන්ට්වල ඉන්න ඕනි විදිහ."

" මමයි මිශෙලුයි පළවෙනි එකේ ඉන්නම්."
යි එමා පැවසුවා ය.

" මමයි ජෝ ජුයි දෙවෙනි එකේ.."
යි ජැක් කිව්වේ ය.

" මමයි වින්කලුයි තුන්වෙනි එකේ ඉන්නම්. "
යි පීටර් පැ වසුවේ ය.

" හරි එහෙනම් මමයි මිසුයි හතරවෙනි එකේ ඉන්නම්." යි බාබරා කීවාය.
පිරිස සවස් වරුව බීම බොමින් සතුටු සාමීචි කතා බහක නිරත වූහ. රාත්‍රී ආහාර ගැනීමෙන් අනතුරුව ටෙන්ට් තුළට වැටිච්ච සැනින් සැමටම නින්ද ගියහ.

* * * * * * * * * * * *

ඊළඟ දවස උදා විය. උදෑසන 7ට පමණ අවදි වූ ගුරුතුමිය, තේ සෑ දීමට පටන් ගත්තා ය. මද වේලාවකට පසුව මිශෙල් නැගිට්ටා ය.
"ගුඩ් මෝනින් මිස්. උදේම නැගිටලා තේ හදනවා වගේ..." ඔයාලා වගේ මම පරක්කු වෙලා නැගිටින කෙනෙක් නෙවෙයි නේ. " යි ගුරුතුමිය සිනා සෙමින් කීවා ය.

කෝ ඔයාගේ රූම් මේට් තාම නැගිට්ටෙ නැද්ද?"
" එයා කොයි වෙලේත් පරක්කු වෙනවනේ තාම හොඳට නිදි." යි මිශෙල් කීවා ය.
මොහොතින් මොහොත පිළිවෙළින් පීටර්, වින්කල්, ජෝර්ජ් , ජැක් , බාබරා හා අවසානයට එමා ද අවදි විය. මොනා උනත් හැම දේකම අන්තිමයා නම් එමා තමයි නේද ?" මිශෙල් මෙලෙස පවසද්දී ගුරුතුමිය තේ ද රැගෙන පැ මිණියා ය.
තේ පානයෙන් අනතුරුව සියල්ලෝම කැම්පින් සයිට් එක වටා ඇවිදීමට කතිකා කර ගත්හ.

පැය 2ක් පමණ කතා බහ කරමින් ඇවිදිමින් පිරිස සතුටු වූහ. ඒත් සමඟ ම මොවුන් අසළින් ලොකු ලොරි රථ 2ක් වේගයෙන් ගියේ ය. එක ලොරියක රෝදයක් මිශෙල්ගේ කකුලක් උඩින් ගියේ ය. වේදනා වෙන් කෑගැසූ මිශෙල් බිම වැ ටුණේ ය.
" මිශේල්......ඉක්මනට මිස් එන්නකෝ."යැයි එමා කෑගැසුවා ය. ගුරුතුමිය ඇතුළු අනෙක් පිරිස ඇය වටා රොක් වූහ.

මිශෙල් තවමත් වේදනා වෙන් කෑ ගසමින් සිටියි. ප්‍රතිකාර කිරීමට යුහුසුලු වූ ගුරුතුමිය, ප්‍රථමාධාර පෙට්ටියෙන් බෙහෙත් ගෙන මිශෙල්ගේ කකුලට ප්‍රතිකාර කළාය. ටික වේලාවක් ගත විය. මිශෙල්ගේ වේදනාව ටිකෙන් ටික පහළ බැස ගියා ය.

" මිශෙල්..,දැන් ඔයාට කොහොමද තාම රිදෙනවද? " යි පීටර් ඇසුවේ ය.
" නෑ  පීටර් දැන් නම් ටිකක් අඩු වුණා. "
" ඔයා ට ඇවිද ගන්න පුලුවන් ද? "
" ටිකක් පුලුවන් "

" අපේ අත අල්ලගෙන ඇවිදින්න බලන්න. " යැයි කියූ පීටර්ගේ හා එමාගේ ද සහාය ඇතිව මිශෙල් ඇවිදීමට පටන් ගත්තාය."අනේ මට ඔය ලොරියේ ගියපු කෙනාව අහුවුණොත්..." මිශෙල් තරහෙන් මෙන් කිව්වාය.

" හරි හරි මිශෙල් අපි එයාව පස්සෙ හොයා ගමු දැන් ඇවිදින්න බලන්න අපිට අයෙ ටෙන්ට් තියෙන තැනට යන්න ගොඩක් දුරයිනේ ඔයාව මාරුවෙන් මාරුවට උස්සගෙන තමා යන්න වෙන්නේ..." යි ගුරුතුමිය පැවසුවා ය. පීටර්ගේ හා එමාගේ සහාය ඇතිව මිශෙල් ඇවිද්දා ය." හරි මිශෙල් ඔයාට දැ න් ටිකක් හරි ඇවිදින්න පුලුවන් නේ. "

" ඔව් මිස් දැන් නම් පුලුවන්. "
" හරි එහෙනම් අපි ආයෙ ටෙන්ට් තියෙන තැනට යමු." යි කියූ ගුරුතුමිය ද සමගින් පිරිස නැවතත් ටෙන්ට් තියෙන තැන බලා ගමන් ඇරඹූහ. පැය 2කින් පමණ ඔවුනට එතැනට යාමට හැකි විය.

" ඔයාටත් මාර වැඩ තමා වෙන්නේ මිශෙල්." බාබරා පැවසුවා ය.
" හැබැයි මම ඒ ලොරිකාරයා ව කොහොම හරි හොයා ගන්නවා."

" මම එයාගේ හැඩරුව නම් ටිකක් දැක්කා ඒ මනුස්සයා උඩු රැවුල වවාගෙන හිටිය තට්ට මනුස්සයෙක්. එච්චරයි දැක්කේ."යැ යි ජෝර්ජ් කිව්වේ ය.

" හරි හරි ඒවා අපි පස්සේ බලමු."යි ගුරුතුමිය මිශෙල්ව ටෙන්ට් එක තුළට රැගෙන ගියාය. දහවල් ආහාරය ගෙන ගීතවලට සවන් දෙමින් සවස් වරුව ගත කර රාත්‍රී ආහාරය ද ගෙන සැවොම නිදා  ගත්හ.

රාත්‍රී 12.30 පමණ විය. එකවර ම එමා තිගැස්සී අවදි විය. ඒ ලොරි රථයක ශබ්දයක් ඇසීමෙනි. ඉක්මනින් තමන් සමඟ නිදා ගෙන සිටි මිශෙල්ව ද අවදි කරමින් දෙදෙනාම ටෙන්ට් එකෙන් පිටත් බැලීය. ලොරි රථ 2ක් එදින තමන් ඇවිදිමින් සිටි පාර දිගේ වේගයෙන් ගමන් කරනු දුටුවේ ය. ඉක්මනින් එමා සහ මිශෙල්, එහා ටෙන්ට් එකේ නිදාගෙන සිටි ජැක් හා   ජෝර්ජ් අවදි කරවීය. ඔවුනට ද මෙම සිදුවීම විස්තර කළහ.

4 දෙනෙකුට මෙම ලොරි රථ ගැ න සෙවීමට නොහැකි බැවින් ඉතිරි 4 දෙනාම ද මොවුන් අවදි කරවීය.

" අපි මේ කවුද කියන එක ගැන හොයන්න ඕනි. මොකද මේ වගේ කෑම්පින් සයිට් එකකට මේ වගේ ලොකු ලොරි එන්න තහනම්. අනික මේ රෑ? ඒක නිසා අපි හැමෝම තම තමන්ගේ ටොර්ච්, ෆෝන්ස් අතට ගන්න. "
යැ යි ගුරුතුමිය උපදෙස් දුන්නා ය.

ටෙන්ට්වලින් පිටතට පැ මිණි පිරිස ලොරි එවල රෝද සලකුණු ඔස්සේ ගමන් කරමින් සිටියි.
ගුරුතුමිය පෙරටු කොට ගත් ළමුන් බියෙන් ඇවිදින්නට වෙයි. මෙම පිරිසට ඉදිරියේ දී කුමක් සදහා  මුහුණ දීමට සිදු වේවි ද?

ඉතිරි කොටස ඊළඟ පොතෙන් බලා පොරොත්තු වන්න.

***- නිමි -***



## පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **“හේමමාලා උපහාර”** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මූලික අරමුණයි.
මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)